**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2025.08.06 වන දින පැවැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ විශේෂ මහා සභා රැස්වීම 2025 අගොස්තු මස 06 වන දින මධ්‍යාහන.12.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

02. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.නිර්මික දිපාල් අබේවර්ධන මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - ඩබ්.එම්. ශ්‍රියානි විරසේකර මැතිතුමිය.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රාජේන්ද්‍රන් තිෂෝක් මැතිතුමා.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඉන්දික කුමාර මැතිතුමා.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.මොහාන් මංජුල මැතිතුමා.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එච්.ජී.සචිනි සෙව්වන්දි මැතිතුමිය.
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය.
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා.
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා.
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා.
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා.
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා.
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය.
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය.
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එම්.ප්‍රදීපා ඉඳුම්ණී කුලරත්න මැතිතුමිය.
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙහන් මෝහන් මැතිතුමා.

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**I. ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

**01.** 2025 වර්ෂයට අදාළව මහා සභා රැස්වීම් සඳහා දින තීරණය කිරීම.

2025 වර්ෂය සඳහා සෑම මසකම 02 වන සතියේ බදාදා දිනය මහා සභාව පැවැත්වීමටත් අගෝස්තු මස පමණක් 20වන දින මහා සභාව පැවැත්වීමට යෝජනා විය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා මහ සභා රැස්වීම් උදෑසන කාලයේ පැවැත්වීම සුදුසු බව යෝජනා කරන ලදි.

ඉහත සඳහන් යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01**

01. 2025 වර්ෂය සඳහා සෑම මසකම 02 වන සතියේ බදාදා දිනය මහා සභාව පැවැත්වීමටත් අගෝස්තු මස පමණක් 20 වන දින මහා සභාව පැවැත්වීමටත්,මහ සභා රැස්වීම් උදෑසන කාලයේ පැවැත්වීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය

02.විද්‍යුත් තැපැල, Whatsapp හරහා සභාව සඳහා වන න්‍යාය පත්‍රය සහ වාර්තාව බෙදා දීමට යෝජනාව හා අදහස් ලබා ගැනීම.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටයේ විද්‍යුත් තැපැල, Whatsapp හරහා සභාව සඳහා වන න්‍යාය පත්‍රය සහ වාර්තාව බෙදා දීමට යෝජනාව ස්ථිර කරන අතර, විද්‍යුත් මාධ්‍ය භාවිතය අවම බැවින් වසරක කාලයක් විද්‍යුත් තැපැල , Whatsapp භාවිතා කරන අතරම තැපැල් මඟින් න්‍යාය පත්‍රය සහ වාර්තාව

ලැබීමට සලස්වන ලෙස යෝජනා විය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ සභාව තුල දමිළ මන්ත්‍රී හා මන්ත්‍රීවරියන් සිටින බැවින් ඔවුන්ගේ අධ්‍යයන පහසුව සඳහා සභා වාර්තාව හා න්‍යාය පත්‍රය දමිල භාෂාවට පරිවර්තනය කර ලබා දෙන ලෙස යෝජනා විය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**

විද්‍යුත් තැපැල , Whatsapp භාවිතා කරන අතරම තැපැල් මඟින් න්‍යාය පත්‍රය සහ වාර්තාව ලැබීමට සලස්වන ලෙස යෝජනාව හා දමිළ භාෂා පරිවර්තක නිලධාරියෙකු සහය ලබා ගැනීමටත්,ඒ සඳහා ගෙවීම් කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය

03. 2025 වර්ෂයට සඳහා පහත සඳහන් කාරක සභා පත්කර ගැනිම හා කාරක සභා සඳහා සංයුතිය සකස් කර නම් කර ගැනිම.

- 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12.1 වගන්තිය අනුව පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ 2025 වර්ෂය සඳහා පහත කාරක සභා පත්කිරීම සුදුසු බවට සභාවට යෝජනා කරමි.
    - I. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව
    - II. කාර්මික සේවා කාරක සභාව
    - III. නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව
    - IV. පරිසර හා පහසුකම් කාරක සභාව
    - V. උපදේශන කාරක සභාව

I. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ අරමුදල් හා සම්බන්ධයෙන් ආදායම්, වියදම් හා ප්‍රසම්පාදන පිළිබඳව මහ සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කළ පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්යය විය යුතුය යන්නත් ,එම කාරක සභාව 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

II. කාර්මික සේවා කමිටුව

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා කාර්මික සේවා කමිටුව නමින් කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික සංවර්ධනය යටිතල පහසුකම් හා නඩත්තු කටයුතු පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කළ පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්යය විය යුතුය යන්නත් ,එම කාරක සභාව 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සාමාජිකයින් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

III. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කළ පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්යය විය යුතුය යන්නත් ,එම කාරක සභාව 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සාමාජිකයින් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

IV. පරිසර හා පහසුකම් කමිටුව

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා පරිසර හා පහසුකම් කමිටුව නමින් කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කළ පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්යය විය යුතුය යන්නත් ,එම කාරක සභාව 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සාමාජිකයින් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යන්නත් සභාවට යෝජනා කරමි.

V. උපදේශන කමිටුව

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා උපදේශන කමිටුවක් පත්කර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 03**

ඒ අනුව1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12.1 වගන්තිය අනුව පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ 2025 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින්ද, කාර්මික සේවා කාරක සභාව කාරක සභාව සඳහා 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සාමාජිකයින් දෙදෙනෙකුගෙන්ද, නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සාමාජිකයින් දෙදෙනෙකුගෙන්ද,පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා 12 දෙනෙකුගෙන් යුත් සභික සංඛ්‍යාවකින් හා බාහිර සාමාජිකයින් දෙදෙනෙකුගෙන්ද, උපදේශන කාරක සභාව සාමාජිකයන් 14 දෙනෙකුගෙන් යුත් කාරක සභාවක් පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**04. ගරු මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් දැක්වීම,**

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාව සඳහා අභිනවයෙන් පත්වූ ගරු උප සභාපතිතුමන්, මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා 35 දෙනා අදහස් ප්‍රකාශ කරමින් අභිනවයෙන් පත්වූ ගරු සභාපතිතුමන් හා ගරු උප සභාපතිතුමන් ඇතුලු ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාට සුභාශිංසන එකතු කළ අතර,සභාව නියෝජනය කිරීමට අවස්ථාව සලසා දුන් පැල්මඩුල්ල කොට්ඨාශ වල ජනතාවට ස්තුතිය පුද කරන ලදි.(සිංහල බසින් හා දමිළ බසින්).ජාති භේද පක්ෂ භේදයකින් තොරව පැල්මඩුල්ල ජනතාවගේ සුබ විහරණය උදෙසා කටයුතු කිරීමටත් ,පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවට නව ආදායම් උත්පාදන මාර්ග හදුන්වා දීමටත්,පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනා එක්වී පැල්මඩුල්ල දියුණු කිරීමටත්,වෙනත් රටවල් සමඟ සහයෝගිතාව ලබා ගෙන පැල්මඩුල්ල සංවර්ධනය කිරීමටත්,වතු ජනතාව කෙරෙහි වැඩි අවධානයක් ලබා දීමටත්,ජනතාවට සේවය කර මන්ත්‍රී වරුන්ගේ ආරක්ෂාව හා ගෞරවය රැකගැනිමටත්,ඉදිරි වසර 04ක කාලය පැල්මඩුල්ල කොට්ඨාශය දියුණු කිරීම එම සභිකවරුන්ගේ ඒකායන අභිලාශය බව ප්‍රකාශ කර සිටියේය.

**වෙනත් කරුණු.**

- **නිවාඩු අනුමත කිරීම.**

මවගේ අභාවය හේතුවෙන් සභාවට පැමිණිමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ CLG/AC/04/05/11 හි 2025.08.06 දිනැති ලිපියට අනුව පළාත් පාලන ආයතන වල මුලික නිතිය පිළිබඳ පුහුණු වැඩසටහන 2025.08.16 දින පෙ.ව.8.30 සිට ප.ව.4.30 දක්වා පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා සියලුම සභිකයන් සහභාගී වන ලෙසත් , ප්‍රවාහන පහසුව සඳහා මිල ගණන් කැඳවා කුලී පදනම මත බස් රථයක සේවාව ලබා ගැනිම සුදුසු බව ගරු සභාපතිතුමන් නිවේදනය කරන ලදි.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

ප.ව.2.20ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2025-08-20 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව